


# කළගුණ දත් සැරියුත් මහ රහතන් වහන්සේ


දේශකයාණන් වහන්සේ

අතිපූජ්‍ය ත්‍රිපිටකාචාර්ය නාඋයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ

සංස්කරණය

පූජ්‍ය මොරගොල්ලේ සුමනයෝගී ස්වාමීන් වහන්සේ

# කළගුණ දත් සැරියුත් මහා රහතන් වහන්සේ




දේශකයන් වහන්සේ

**අතිපූජ්‍ය ත්‍රිපිටකාචාර්ය**

**නා උයනේ අරියධම්ම ස්වාමීන් වහන්සේ**

සංස්කරණය:

**පූජ්‍ය මොරගොල්ලේ සුමනයෝගී ස්වාමීන් වහන්සේ**



ශ්‍රී රෝහණ යෝගාශ්‍රමය,

පුහුල්වැල්ල, මාතර.


ධර්ම දානය වශයෙන් නොමිලේ බෙදාදීම පිණිසයි.

නාලනී ඩබ්ලිව්. අබේගුණවර්ධන වන මාගේ ස්වාමි පුරුෂයා වූ ජී. ටී. විමලදාස මහතා ඇතුලු මිය ගිය සියළුම ඥාතීන්ට පිං පිණිස හා දූ දරුවන්ට නිරෝගී සුවය ප්‍රාර්ථනා කිරීම හා මට නිරෝගී සුව පැතීම.

නාලනී අබේගුණවර්ධන

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස !!!**

**"නිධීනංව පවත්ථාරං යංපස්සේ වජ්ජ දස්සිනං**
**නිග්ගහියවාදිං මේධාවිං තාදිසං පණ්ඩිතං භජේ**
**තාදිසං භජමානස්ස සෙයෙයා් හෝති න පාපියෝති"**

ශ්‍රද්ධාවන්ත පිංවතුනි!

තුන්ලෝකාග්‍ර වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් සැවැත්නුවර ජේතවන මහා විහාරයේදී ශාරිපුත්ත්‍ර මහාරහතන් වහන්සේගේ කළගුණ සැලකීමක් නිමිත්තෙන් දේශනා කළ ගාථාවක් මේ සඳහන් කරන්න යෙදුනෙ ධර්ම දේශනාව සඳහා ධම්මපදයේ පණ්ඩිත වර්ගයේ මුලින්ම තිබෙන ගාථාවයි. එම ගථාවේ තේරුම නම්,

**නිධීනංව පවත්ථාරං**
පොලවේ සැගවීතිබෙන නිධානයක් පෙන්වන්නාක් මෙන් කරුණු කියා දෙන්නා වූ

**වජ්ජ දස්සිනං**
අනුන්ගේ සුළු සුළු වූ ද වරද දැක අවවාද දෙන්නා වූ

**නිග්ගහිය වාදිං**
වරදට අනුරූපව අවවාද කරන්නා වූ

**මේධාවිං**
තැනට සුදුසු නුවණින් කරුණු කියා දෙන්නා වූ

**පණ්ඩිතං පස්සේ**
ඥානවන්ත කෙනෙක් දකින්නේනම්

**තාදිසං පණ්ඩිතං භජේ**
එවැනි කල්‍යාණ මිත්‍රයෙක් ආශ්‍රය කරන්න

**තාදිසං භජමානස්ස**
එවැන්නෙකු ආශ්‍රය කරන්නාට

**සෙයෙ‍‍‍්‍යා හෝති න පාපියෝ**

දියුණුවක්ම වන්නේය ඒකාන්තයෙන්ම පිරිහීමක් නොවන්නේය කියන එකයි ගාථාවේ තේරුම පොලවේ සැගවී තිබෙන නිධානයක් පෙන්වනව වගේ කරුණු කියා දෙන අනුන්ගේ ස්වල්පවූද වරද පෙන්වා දෙන, වරදට අනුරූපව අනුශාසනා කරන, තැනට සුදුසු නුවණින් කටයුතු කරන නැණවත් කල්‍යාණ මිත්‍රයෙක් දකින්නට ලැබුනා නම් එවැනි කල්‍යාණ මිත්‍රයෙක් සේවනය කරන්න එවැනි කල්‍යාණ මිත්‍රයෙක් සේවනය කරන කෙනාට දියුණුවක්ම සිදුවෙනව මිස පිරිහීමක් සිදුවන්නේ නැහැ.

බුදුරජාණන් වහන්සේ දිනක් ජේතවනාරාමයේ කුටියෙන් කුටියට බලාගෙන වඩින අවස්ථාවේදී දකින්න ලැබෙන එක්තරා කුටියක් අසල මිදුලේ තණකොළ ගලවමින් හිටිය වයෝ වෘධ උපාසක මහත්තයෙක් බුදුරජාණන් වහන්සේ ඔහු වෙත වැඩම කරල ඔහුගෙන් ඇහුව පිංවත ඔබ කවුද?

ඒ වයසක උපාසක මහත්තයා පිළිතුරු දුන්නා ස්වාමීනි මම රාධ .... මගේ නම රාධ ..... භාග්‍යවතුන්වහන්සේ ඇසුව ඔබ මොකද්ද මෙහි කරන්නෙ?

ස්වාමීනි, මම මෙහි නරත වී සංඝයාට සුළු උපස්ථානකරනව මම මළු පෙත් මං අමදිනවා කැලි කසල ඉවත් කරනව, මළුවෙ හැදෙන තණකොළ ඉවත් කර දානව. සංඝයාගෙන් ලැබෙන දෙයක් අනුභව කරල මම, මෙහි නරත වී පිනක් කර ගන්නව කිව්වා.

භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ඇසුව රාධය ඔබ කැමතිද පැවිදි වෙන්න? එතුමා කියා සිටියා. අනේ සාදූ සාදූ ස්වාමීනි මම පැවිදිවෙන්න කැමතියි. ඒත් මාව මහණ කරගන්න කිසිම ස්වාමීන් වහන්සේ නමක් කැමති නැහැ. මම වයස්ගතයි කියනවා. ඉන් අනතුරුව බුදුරජාණන් වහන්සේ වැඩම කලා දම් සභා මණ්ඩපයට, එම දම් සභා මණ්ඩපයට සංඝයා

දහස්ගණනක් රැස්වෙලා හිටියා බණ අහන්න. බුදුරජාණන් වහන්සේ සංඝයාගෙන් අසා වදාළ මහණෙනි, මේ සේනාශනයේ ඉන්නව නේද රාධ කියල වයෝ වෘධ උපාසක මහත්තයෙක්.

සංඝයා එහෙමයි ස්වාමිනි රාධ කියල උපාසක කෙනෙක් ඉන්නව කිව්වා.

බුදුරජාණන් වහන්සේ ඇහුව මහණෙනි, ඒ රාධ උපාසක මහත්තයාගෙන් මෙම සංඝයාගෙන් කාටහරි යම් කිසි උපකාරයක් ලැබිල තිබෙනවද?

ඒ විශාල සඟ පිරිස නිශ්ශබ්දයි. ඒ අතර සඟ පිරිසේ වැඩ හිටිය ශාරිපුත්ත මහරහතන් වහන්සේ නැගිටල බුදුරජාණන් වහන්සේට වැදල කිව්ව මෙම රාධ උපාසක තුමාගෙන් මට උපකාරයක් ලැබිල තිබෙනවා කියා.

බුදුරජාණන් වහන්සේ ඇසුව. ශාරිපුත්‍රය මොණවගේ උපකාරයක්ද එතුමාගෙන් ඔබට ලැබුනෙ.

ස්වාමිනි ! මම සෑම දවසේම පිඩු සිගා වඩින්නේ ප්‍රමාදවෙලා මෙහි ඇති සෑම කුටියක් සෙනසුන් ගානේ මම පරීක්ෂාකර බලනව. මළුපෙත් ඇමදලා නැත්නම් අමදිනව. ඉදල් කොහු නියමිත තැන්වල තබා නැත්නම් ඒවා තැම්පත් කරලා තියනව දොර ජනේල් හරියට වහල නැත්නම් ඒව වහල සියල්ලන්ටම පස්සේ තමයි මම පින්ඩපාතේ වඩින්නේ.

ස්වාමිනි ඒවාගේ දවසක් මම වඩින කොට හොදටම දවල්වෙලා පාර අයිනේ මේ උපාසකතුමා ඉදගෙන අත දිගුකරලා මට පෙන්නල කිව්ව ස්වාමිනි, අන්න අර පෙනෙන ගෙදරට වඩින්න. එතනට වැඩියොත් ප්‍රමාද නොවී දානය ලැබෙනව කිව්වා. ඒවගේම මෙතුමාගේ වචනය පිළිගෙන මම එම ගෙදරට පිඩුසිඟා වැඩියාම මට ප්‍රමාණවත් තරම් දානය

ලැබුන. එදා ඉර අවරට යන්නට පෙර මට දානය ගන්නට හැකි වුනේ මේ රාධ උපාසකතුමා මට එදා දානය ලැබෙන තැන පෙන්නූ නිසයි. ස්වාමීනි, අන්න ඒ උපකාරය මට හොදට මතකයි කීවා.

බුදුරජාණන් වහන්සේ වදාළ එසේ නම් ශාරීපුත්‍රය මේ රාධ උපාසකතුමා පැවිදිවෙන්න කැමතියි. ඉතිං ශාරීපුත්‍රය ඔබට එදා කළ උපකාරයට ප්‍රත්‍ය උපකාරයක් වශයෙන් එතුමාට පැවිදිවෙන්නට උපකාර කලොත් හොඳයි නේද? කියා ඇහුවා.

සැරියුත් මහා රහතන් වහන්සේ බොහෝම සතුටින් යුතුව සාදු සාදු ස්වාමීනි මම ඒ උපකාරය කරන්නම් කියල භාග්‍යවතුන් වහන්සේගෙන් අවසරගෙන ගොස් තමන් වහන්සේම තචපඤ්චක කර්මස්ථානය දීල එතුමාගේ හිසකෙස් බෑව තමන් වහන්සේම එතුමාගේ ඇගේ මැටිගාල නාවල කහ දියරෙන් දෝවනය කරල පිරිසිදුකරල ගිහිගඳ ඇරිය සැරියුත් ස්වාමීන් වහන්සේගේම සිවුරු පිරිකර දීල අන්දවල පෙරවල පැවිද්ද ලබා දුන්න. උපසම්පදාවත් ලබා දුන්න. මෙම රාධ ස්වාමීන් වහන්සේ දැන් වයොවෘධයි. අවුරුදු එකසිය විස්සක් තරම් වයසයි. ඒක නිසා ශාරීපුත්‍ර මහා රහතන් වහන්සේ තමන් වහන්සේගේ ම කුටියේ තැනක අර රාධ ස්වාමීන් වහන්සේ නතර කර ගත්තා. තමන් වහන්සේම දැහැටි උණුපැන් සිසිල් පැන් ආදිය දෙනවා. පිණ්ඩපාතය ගෙනත් පිළිගන්වනව. සියලුම වත් පිළිවෙත් කරනව. මේ සියල්ලම ශාරීපුත්‍ර මහා රහතන් වහන්සේගේම අතින්ම සිදු කලා. එපමණක් නොවෙයි නිතර නිතර අවවාද උපදෙස් දෙනවා.

වාඩිවෙන්න මෙහෙමයි. සිවුර පෙරවන්නෙ අදනෙ අදින්නෙ මෙහෙමයි. පටිය බදින්නෙ මෙහෙමයි. ප්‍රත්‍යාවේක්ෂා කරන්නෙ මෙහෙමයි. වැඩිහිටියන් හට වදින්නෙ මෙහෙමයි. ගමනක් යන්නෙ මෙහෙමයි. කථා කරන්නෙ මෙහෙමයි. පාත්‍රය හෝදන්නෙ මෙහෙමයි. මේ සියල්ලම කියල දුන්න. වැසිකිළියෙදි පවතින්නෙ

මෙහෙමයි. කැසිකිළියෙදි පවතින්නෙ මෙහෙමයි. සැතපෙන්නෙ මෙහෙමයි. මේ සියල්ලම කියල දුන්න.

ඒ අතරට භාවනා කිරීම සම්බන්ධව නිතර නිතර උපදෙස් දුන්නා. මෙම රාධ ස්වාමීන් වහන්සේද වයෝවෘධයි කියල කිසිම දරදඬුකමක් නැහැ. බොහෝම නිහතමානීව මේ දෙන අවවාද අනුශාසනා පිළිගන්තා. ඒවා පිළිගෙන වත්පිළිවෙත්වල යෙදී නිරතුරුවම භාවනාවේම යෙදී සිට වැඩි දවසක් යන්නට පෙර සියලුම කෙළෙස්නසා මහා රහත්භාවයට පත්වුනා. එම පුවත බොහෝ භික්ෂූන් වහන්සේලා විසින් භාග්‍යවත් බුදුරජාණන් වහන්සේට දැනුම් දුන්නා. ස්වාමිනි භාග්‍යවතුන් වහන්ස ! මේ ශාරිපුත්ත මහා ස්ථවිරයන් වහන්සේ පුදුමවිදියේ ගිලානෝපස්ථානයක් වයෝවෘධ උපස්ථානයක් කරනවා නේද කිව්වා තමන් වහන්සේට පිණ්ඩපාතය වඩින්නට පාර පෙන්වා දුන් උපකාරයට පුදුමාකාරයේ කළගුණ සැලකීමක් සිදුකරනව. මේක නම් ආශ්චර්‍යයයි කියල සාකච්ජාවක් ඇතිවුනා. එතනට බුදුරජාණන් වහන්සේ වැඩම කරල මේ ප්‍රවෘත්තිය පහදා දුන්නා.

මහණෙනි, මේ ශාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ අද පමණක් නොවෙයි පූර්ව ජාතිවලදිත් කළ ගුණ දන්න කළ ගුණ සලකන ඉතාම සත්පුරුෂ ගුණ ඇති උතුමෙක් කිව්වා. ඒ වෙලාවේදී භික්ෂූන් වහන්සේලා ආරාධනා කලා. ස්වාමිනි භාග්‍යවතුන් වහන්සේ එවැනි පූර්ව ආත්ම භාවයක් ගැන අපට අහන්න ලැබේවා කියා ආරාධනා කලා. ඒ වේලාවේදී සර්වඥයන් වහන්සේ පහදා දුන්නා මහණෙනි ! මේ ශාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ ඈත අතීතයේ භවයකදී හිමාල වනාන්තරයේ ඇත් රංචුවක නායක ඇතෙක්වෙලා හිටිය ගංගා නම් ගඟේ ඉහත්තේ තමයි මේ ඇතා වාසය කලේ. ඔය අතර බරණැස්නුවර වඩු මහත්වරු කණ්ඩායමක් පාරු හදාගෙන මෙම ගඟේ ඉහලට ගිහිල්ල ඒ වනාන්තරයේ කඳවුරු බැදගෙන ගස් කපල දැව ඉරල දොර,උළුවහු, මේස, පුටු, අල්මාරි, ජනෙල් මේ ආදී ගෘහ භාණ්ඩ හදල ගඟේම පාරුවෙන් ගෙනැවිත් නගර වැසියන්ට විකුණලා ජීවත්වෙන සිරිතක් තිබුණ.

මෙසේ වරින්වර හිමවත් පෙදෙසට යන එන වඩු මහත්වරු කණ්ඩායම කඳවුරු බැඳගෙන නතර වෙලා ඉන්න අසල මේ ඇතාගේ පාදයක ලොකු උලක් ඇනිල ඇතාට යන්න එන්න බැරිව බිම හරහා වැටිල හිටිය මේ ඇතා දැක්ක මේ වඩු මහත්වරු කණ්ඩායම ඇතා ලගට ලංවෙලා ඇතාට කියා සිටිය ඇත්රාජයණි, ඔබ කල බලවෙන් නැත්නම් අපි මේ උල ගලවලා බෙහෙත් කරල තුවාලය සනීපකරන්නම් කිවා. එහෙම කියල මේ අය ඇතාට කෑම ගෙනත් දුන්න. කෑම දෙද්දී කෑම අනුභව කරද්දී බෙහෙත් වතුර සකස් කරල ඒ බෙහෙත් වතුරෙන් අර උල ඇණුන තැන පොගවලා උල ගලවලා ලේ, සැරව, ඉවත් කරල තුවාලය සෝදලා පිරිසිදු කරල බෙහෙත් යොදල බෙහෙත් බැන්ද, නැවත නැවත කෑම ගෙනල්ල දෙනව. වතුර ගෙනත් දෙනව. ඇතා ලග පිරිසිදු කරනව. වරින් වර බෙහෙත් වතුරෙන් සෝදමින් බෙහෙත් ගල්වමින් වැඩි දවසක් යන්න ඉස්සර මේ දරුණු තුවාලය සනීපකලා. දැන් ඇතාට නැගිටින්න පුළුවන් වුනා.

මේ ඇතා කළගුණ දන්න සතෙක් නිසා තිරිසන් සතෙක් වුනත් ගොදුරු සොයාගෙන වනාන්තරයට ගියත් නැවත මේ වඩු මහත්වරු ඉන්න තැනට සොයා ගෙන එනව. ඇවිත් නිකම් ඉන්නේ නැහැ. ඒ වඩු මහත්වරු ගහක් කපනවානම් ගහ පෙරලල දෙනව. ගහ කුට්ටිකලාම ඒ කොට පලංචියට ඔසවන්න ඕනෑ වුනාම මේ ඇතා ඔසවල පලංචියේ තබනව. ඊලගට ලී ඉරුවාම ඒ ලී බිමට බාල දෙනව බිමට බාන ලී දඬු වඩු මඩුවට ගිහින් දානව. මේ විදිහට කිසිම කෙනෙකුගේ උපදේශයක් නැතිව මේ ඇතා හිතා මතා මේ උපකාරය කරනව. වඩු මහත්වරුන්ට පුදුමයි මේ ඇතාට තමන් කරපු උපකාරයට ඇතා තමන්ට කරන උපකාරය ගැන ඒ අයට පුදුම හිතුනා.

ඔහොම කාලයක් ගතවන විට අර වඩු මහත්වරු ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරල මේවා අරගෙන පිටත්වෙන්න සූදානම් වන බව දැනගන්න අර ඇත්රාජයා ඇත් රංචුවෙන් කුඩා ඇත් පැටවෙක් ගෙනල්ල තෑගි කලා. වඩු මහත්වරු මෙම ඇත්පැටවා අරගෙන ගොස් හදා වඩා ගත්තා.

බුදුරජාණන් වහන්සේ දේශනා කලා මහණෙනි ! එදා ඒ ඇත් රාජයා වී සිටියේ මෙම ශාරිපත්ත ස්ථවිරයන් වහන්සේ ශාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ සිව්පා සතෙක් වී සිටි කාලයේදීත් තමන්ට කළා වූ උපකාරයට ප්‍රත්‍ය උපකාර කරල තිබෙනවා. මෙම ධර්මතාවය මේ ශාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ විසින් දීර්ඝ කාලයක් පුරුදු පුහුණු කලා වූ ශ්‍රේෂ්ඨ ගුණයක් බව පහදා දෙමින් මෙම ගාථාවෙන් ධර්ම දේශනා කලා. ශාරිපුත්ත මහා රහතන් වහන්සේ **නීධීනංව පවත්ථාරං** නිධානයක් පෙන්වන්නා සේ අන් අයට සුගති මග නිවන් මග පහදා දෙනව. **වජ්ජ දස්සිනං** ඇසුරුකරන්නාගේ ස්වල්ප වූ ද වරද දකිමින් ඒ වරදට අනුරූපව අවවාද අනුශාසනා කරනව. **නිග්ගහියවාදිං** දැන දැන වරද කරන අයට නිග්‍රහ කරමින් ම අවවාද කරනව. **මේධාවිං** තැන නොතැන බලා තැනට සුදුසු පරිද්දෙන් නුවණ හසුරුවනවා. මෙන්න මේ කියන ගුණාංග ඇති බැවින් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වැනි කල්‍යාණ මිත්‍රයන් ම ඇසුරු කළ යුතුයි කියන එක පහදා දෙමින් මෙම ගාථාවෙන් ධර්මය දේශණා කලා.

මෙම දේශනාව තුලින් අපට තේරුම් ගැනීමට කරුණු රාශියක් තිබෙනව. අපි සංසාරයේදී දන්දීල, සිල්රැකලා, භාවනා කරල, මව්පිය උපස්ථාන කරල කල්‍යාණමිත්‍ර සම්පත්තියක් ප්‍රාර්ථනා කරමින් ආව එම උතුම් කල්‍යාණ මිත්‍ර සම්පත්තිය දැන් අපට ලැබිල තිබෙනව. ඒ කවර විදියේ කල්‍යාණ මිත්‍ර සම්පත්තියක්ද? බුද්ධරත්නය, ධර්මරත්නය, සංඝරත්නය, කියන මෙම රත්නත්‍රයයි මෙම රත්නත්‍රයේ කල්‍යාණමිත්‍ර සම්පත්තිය මත තමයි ගිහිපැවිදි බෞද්ධයෝ අද සුගති මගට නිවන් මගට යොමු වී කටයුතු කරන්නෙ අපි හිතන්නට ඕනැ. මේක එසේ මෙසේ වාසනාවක් නොවෙයි. මනුෂ්‍යලෝකයේ කොතෙකුත් කෝටිගණන් මනුෂ්‍යයෝ හිටියත් නියම ශාස්තෘන් වහන්සේ කෙනෙක් ඒ හැමෝටම ඇත්තේ නැහැ. කෙනෙක් දෙවියන් අදහනව තවත් තවත් අය නොයෙක් නොයෙක් ඇදහිලිවල බැසගෙන ඉන්නව. බොහෝ දෙනා නියම සම්මාදිට්ඨියෙන්

තොරවයි ජීවත්වෙන්නෙ. එසේ නමුත් අපේ බෞද්ධයෝ කුඩාකලපටන් මවගේ කුසතුල ඉන්න කාලේ පටන් ම අපට ආභාෂය ලැබිල තිබෙන්නේ රත්නත්‍රයේ ආශිර්වාදය පදනම් කරගෙනයි. ඒ රත්නත්‍රයේ සරණ පිහිට කර ගැනීම තමයි. නියම කල්‍යාණ මිත්‍ර සම්පත්තිය.

දිනක් ආනන්ද මා හිමියන් වහන්සේ බුදුරජාණන් වහන්සේ හමුවේදී මේවාගේ අදහසක් ප්‍රකාශ කලා. ස්වාමීනි! මට වැටහෙනව මේ බුදුසසුනේ භාගයක්ම පවතින්නේ කල්‍යාණ මිත්‍රයා නිසයි කිව්ව. ඒ වෙලාවේදී බුදුරජාණන් වහන්සේ ඒ කාරණය ප්‍රතික්ෂේප කලා. **මාහේවං ආනන්ද මා හේවං ආනන්ද** ආනන්දය, එහෙම කියන්න එපා. එහෙම කියන්න එපා ආනන්දය. **සකල මේවහිදං ආනන්ද බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණ මිත්තතා කල්‍යාණ සහයතා.**

ආනන්ද බුදුසසුනේ බාගයක් නෙවෙයි සකල විධ බුද්ධ ශාසනයම කල්‍යානමිත්‍ර සම්ප්තියක් කල්‍යාණ මිත්‍ර සහායතාවක් මතයි පවතින්නේ. **මමංහි ආනන්ද කල්‍යාණ මිත්තං ආගම්ම ජාති ධම්මා සත්තා ජාතියා පරිමුච්ජන්ති** ආනන්දය නැවත නැවත ඉපදීම ස්වභාවකොට ඇති සත්වයෝ තථාගතයන් වහන්සේ නැමති කල්‍යාණ මිත්‍ර සම්පත්තිය වෙත පැමිණිලා ඉපදීමක් නැති අජාති සංඛ්‍යාත අමාමහ නිවනට පත් වෙනවා. **ජරාධම්මා සත්තා මමංහිආනන්ද ආගම්ම ජරාධම්මා පරිමුච්ජන්ති.** දිරදිරායන සුළු ආත්මභාව ඇති සත්වයෝ තථාගතයන් වහන්සේ වෙත පැමිණ ජරාවක් නැති අජර වූ අමාමහ නිවනට පත්වෙනවා. **ව්‍යාධිධම්මා සත්තා ව්‍යාධිනා පරිමුච්ජන්ති** තථාගතයන් වහන්සේ වෙත එන ලෙඩ රෝග හැදෙන සුළු සත්වයෝ ලෙඩරෝග නැත්තා වූ අව්‍යාධි නිර්වාණ ධාතුවට පත් වෙනවා.

**මරණධම්මා සත්තා මරණේන පරිමුච්චන්ති** මැරෙන සුළු සත්වයෝ තථාගතයන් වහන්සේ නැමැති කල්‍යාණ මිත්‍ර සම්පත්තිය වෙත පැමිණිලා අමෘතමහා නිර්වාණ ධාතුවට පත් වෙනවා. **සෝක පරිදේව දුක්ඛ දෝමනස්ස උපායාසා ධම්මා සත්ථා සෝක පරිදේව දුක්ඛා දෝමනස්ස උපායාසේහි පරිමුච්චන්ති** ආනන්දය හඩනසුළු සත්වයෝ ද සෝක වන සත්වයෝද කායික දුක් විඳින සත්වයෝද, මානසික දොම්නස් විඳින සත්වයෝද දැඩි ආයාස ඇති සත්වයෝද, තථාගතයන් වහන්සේ නැමැති කල්‍යාණමිත්‍රයන් වහන්සේ වෙත පැමිණ ඒ සියලුම සෝකාදියෙන් අතමිදී අශෝක අනුපාසාය නිර්වාන ධාතුව කෂාත්සාත්කර ගන්නව. එබැවින් ආනන්දය, බුදුසසුනෙහි බාගයක් නොව සම්පූර්ණ බුදුසසුන නියම කල්‍යාණමිත්‍ර සහායතාවයක් වෙනවා කියන එක පහදා දෙමින් ධර්ම දේශනා කලා.

මෙම ධර්මදේශනාව තුලින් අපි තේරුම් කර ගනිමු. අපට මේ බුද්ධ ශාසනය නැමති කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ලැබී තිබෙනවා. අපි මුලින් සඳහන් කලා නේද රාධ ස්වාමීන් වහන්සේ අවුරුදු එකසිය විස්සක් වයස ඇති ව බුදු සසුනේ පැවිදි වී රහත්වුන කථාව. අද මේ කාලයේ ඉන්න මව්පියන් අතර අවුරුදු එකසියවිස්සක් පිරුණු කෙනෙක් නැහැනෙ. එසේ නමුත් මේ වයෝ වෘධ හැම කෙනාම හිතන්නට ඕනෑ. අපට මේ ලැබෙන විනාඩියක් විනාඩියක් පාසා අපටත් රහත්වීමට වාසනාව තිබෙනව කියල අපි හිතන්නට ඕනෑ කොහොමද එහෙම වෙන්නෙ.

අපි නිත්‍ය වශයෙන් පංචශීලය හොඳට ආරක්ෂා කර ගන්නවා. බුද්ධ වන්දනාව කරනව මෛත්‍රී භාවනාව කරනව. ත්‍රී ලක්ෂණ විපස්සනා වඩනව. මේවා හරියට කරනව නම් වයස නියමයක් නැහැ. මේ කෙළෙසුන් නසා මගඵල නිවන් සුව ලබන්නට මහත් උපකාරයක් වෙනව. එබැවින් අපි කරුණාවෙන් ආරාධනා කරනව. මේ වයෝවෘධ මවුපියන් සැමටත් සියලුම

දෙනාටත් අතරක් නෑර හිත පිරිසිදු වෙන හැටියට තමන්ගේ භාවනා මනසිකාරයක් නිතර නිතර පුරුදු කර ගනිත්වා කියන ඇරයුම අපි ඉතා මෛත්‍රියෙන් සිදුකරනවා.

පිංවතුනි! මේ ශාරිපුත්ත මහා රහතන් වහන්සේ ධම්මද්ධජ ජාතක දේශනාවේදි 'චත්තපානී' නමින් කපුමහත්තයෙක් වී සිටිය. එතුමාට දීර්ඝකාලයක පටන් පැවතුනා වූ ප්‍රාර්ථනා හතරක් තිබුන. ඒ ප්‍රාර්ථනා හතර නම්,

1. **කිසිදාක කිසිම කෙනෙක් ගැන ඊර්ෂ්‍යාකරන්න නොලැබේවා !**
2. **කිසිදාක කිසිම කෙනෙක් ගැන ක්‍රෝධකරන්න නොලැබේවා !**
3. **කිසිදාක කිසිම තැනකදී මද්‍යසාරයක් පාවිච්චි කරන්නට නොලැබේවා !**
4. **කිසිදාක කිසිතැනකදී හිත ඇති හිත නැති කිසිවක් ගැන තෘෂ්ණාවක් ආශාවක් ඇති නොවේවා !**

මෙම ගුණාංග හතර ශාරිපුත්ත මහා රහතන් වහන්සේ විසින් පෙර සසර පටන් පුරුදු පුහුණු කරගෙන ආව.

කිසිකලෙක කිසිවෙකුට ඊර්ෂ්‍යා කරන්නේ නැහැ කිව්වේ. සැරියුත් ස්වාමීන් වහන්සේ පූර්ව ජාතියකදී රජ කෙනෙක්ව හිටිය ඒ රජතුමාගේ හිටිය ඉතාම සිල්වත් ගුණවත් අගරජ කෙනෙක්. එතුමා හරිම ලස්සනයි. ඒ අපේ බෝධිසත්වයන් වහන්සේයි. බෝධි සත්වයන් වහන්සේ මේ රජ්ජුරුවන්ගේ අග රජතුමා නැත්නම් අග්‍රාමාත්‍යතුමා වෙලයි හිටියේ එතුමා බොහෝම ශිලවන්තයි. බොහෝම ගුණගරුකයි. බොහෝම සත්‍යවාදී උත්තමයෙක් ඒ අතරට එම රජතුමාට එම රාජ්‍යයේ පිටිසර පලාතක කැරැල්ලක් සන්සිදුවන්න යන්න සිද්ධවුනා. මාස කීපයකට, අග්‍රාමාත්‍යතුමාට රාජ්‍ය පාලන කටයුතු පවරලයි

රජතුමා ඒ ගමන ගියේ, එම රජතුමාගේ අග්‍රමහේෂිකාව ඉතාම දුශ්ශීලයි එම අග්‍රමහේෂිකාව විසින් අර රූපවන්ත වූ බොහෝම ක්‍රියාශීලී වූ ආග්‍රාමාත්‍යතුමාණන්ට වැරදි ආරාධනාවක් කලා. තමා සමීපයට එන්නයි කියල. එහෙත් මෙම අග්‍රාමාත්‍යතුමා එවැනි පාපයකට කවදාවත් හිතෙන්වත් සහභාගි වෙන්නේ නැහැ. ඒක නිසා මේ රාජ දේවිය මහ රජතුමා ආපසු ආවට පසුව මහා අමූලික බොරුවකින් අග්‍රාමාත්‍යතුමාණන්ට චෝදනා කලා.

රජ්ජුරුවන්ට දරාගනන්න බැරි වුනා. ඊර්ෂ්‍යාව, නපුරු චේතනාව, රජතුමා කිසිම නඩු විභාගයක් වග විභාගයක් නැතිව මේ තරම් නිවැරදි මේ තරම් සත්‍යවාදී මේ තරම් ශීලවන්ත මේ තරම් ගුණගරුක අග්‍රාමාත්‍යතුමාට මරණීය දණ්ඩනය නියම කලා එම අග්‍රාමාත්‍යතුමා බොහෝම බුද්ධිමත් කෙනෙක් නිසා ඒ අවස්ථාවේදී මහ රජතුමාට කියා සිටිය. දේවයන් වහන්ස ! තමුන් වහන්සේගේ සෙවනේ මම මෙච්චර කාලයක් සේවය කලා. තමුන් වහන්සේට මගේ අබමල් රේණුවක තරම්වත් වරදක් දකින්න ලැබිල නැහැ නේද ? තමුන් වහන්සේට යම් කෙනෙක් යම් පැමිණිල්ලක් කලා නම් මාව ඔබතුමා සමීපයට කැඳවලා ඒ සම්බන්ධව විනිශ්චයක් කරන්න විභාගයක් කරන්න. එසේ විනිශ්චයක් කරල ඉන් පසුව මාව වරදකරුවෙක් නම් මට දඩුවම් දෙන්න නැතිනම් මාව නිදහස් කරන්න. ඒ සඳහා තමුන් වහන්සේ ඥාණවන්ත වෙන්න කීවා. රජතුමාට මේ කාරණය තේරුනා රජතුමා කාරණය වටහාගෙන සත්‍යක්‍රියාවක් කලා මෙහෙම.

මගේ ජීවිතය පුරාම නිත්‍ය වශයෙන් පංච ශීලය ආරක්ෂා කලා. පොහොය අටසිල් රැක්කා. මවුපිය උපස්ථාන කලා. සතර සංග්‍රහ වස්තුවෙන් මහ ජනයා හට සංග්‍රහ කලා. ඒ සත්‍යානුභාව බලයෙන් මට මේ වාගේ ඊෂ්‍යීාවක් නිවන් දකිනා ජාති දක්වාම මගේ හිතේ පහළ නොවේවා. සෑම දෙනාගේම සම්පත් කෙරෙහි සතුටු වීමේ මුදිතා ගුණය මට භවයක් පාසා පිහිටාවා කියා අධිෂ්ඨාන කලා. මෙන්න මේ ගුණය ශාරිපුත්‍ර මහ

රහතන් වහන්සේගේ පෙර සිට පැවත එන ශ්‍රේෂ්ඨ ගුණයක් බව බුදුරජාණන් වහන්සේ එදා පහදා දුන්නා. එදා රජතුමා වී සිටියේ ශාරීපුත්‍ර මහ රහතන් වහන්සේ එදා අග්‍රාමාත්‍යතුමා අපේ බෝසතාණන් වහන්සේ.

කිසිදාක කිසිකෙනෙකුට ක්‍රෝධ නොකරනව කිව්වේ. ශාරීපුත්ත මහ රහතන් වහන්සේ පෙර ජාතියකදී වනාන්තර ගතව තවුස්දම් පුරමින් හිටිය උන්වහන්සේගේ නම ''අරක'' තාපසතුමා. ඒ ''අරක'' තාපසයන් වහන්සේ හත්දවසක් මුලුල්ලෙහි මෛත්‍රී ධ්‍යාන වැඩුව. එම මෛත්‍රී ධ්‍යාන බලයෙන් මහා කල්ප අටක් පුරාම ආභස්සර බ්‍රහ්මලෝකයේ බ්‍රහ්ම සැප වින්දනය කලා. ඉන් අනතුරුව සක්දෙව් රජපදවිය තුන්සියවාරයක් කලා. චක්‍රවර්ති රාජ්‍යය පන්සිය වාරයක්ම කලා වෙනත් ප්‍රදේශ රාජ්‍ය ලැබූ වාර ගණන අපමණයයි. මේවා පෙර විසූ ආත්ම දැකිය හැකි නුවණ පහළ වී අධිෂ්ඨාන කලා. මෛත්‍රී භාවනාව දින හතක් වැනි කෙටි කාලයක් ප්‍රගුණකිරීමෙන් මේ තරම් අනුසස් ගෙන දෙන බැවින් නිවන් දකිනා ජාති දක්වා මාගේ සිතේ ක්‍රෝධයක් වෛරයක් ඇති නොවී මෛත්‍රීය පිහිටාවා කියා අධිෂ්ඨාන කලා.

කිසිදාක මද්‍යපානයක් නොකරන්නේ කුමක් නිසාද ? එම ශාරීපුත්ත ස්වාමීන් වහන්සේ පෙර ජාතියකදී ''ජත්තපාණී'' කියා රජකෙනෙක් ව හිටිය මෙම ජත්තපාණී රජතුමා බොහොම ධාර්මිශ්ඨයි පෝය දවසට සතුන් මැරීමත් මස් අලෙවි කිරීම එම රාජ්‍යයේ සපුරාම තහනම් එසේ නමුත් මෙම රජ්ජුරුවන් ට සෑම දවසේදීම මද්‍යපානයත් ඕනෑ. මාංශ ආහාරයත් ඕනෑ කරනව. රජතුමාට ආහාර පාන පිළියෙළ කරන අරක් ඇමියා පෝය දවසට පෙර දවසේදී මස් කැටියක් ප්‍රවේශම් කරල තියාගන්නව. පෝය දවසේදී රජතුමාට ආහාර සපයන්නට ඔය අතරකදී රජ ගෙදර බල්ලෙකු ඒ මස් කැටිය ඩැහැගෙන ගියා පෝය දවසට උයන්න මස් නැති වුනා. බියට පත් වූ අරක්ඇමියා ගිහිල්ලා රාජමහේෂිකාවට කිව්වා. දේවීන් වහන්ස ! මම අද කොහොමද රජ්ජුරුවන්ට ආහාර සකස් කරන්නෙ, තිබුන මස්කැටිය බල්ලෙකු

ඩැහැගෙන ගිහිල්ල අද මේ නගරයේ වෙළඳ සැල්වල කොතනකවත් මස් ටිකක් සොයාගන්නට නැහැ. දේවීන් වහන්ස දැන් මම මොකක්ද කරන්නෙ කියල ඇහුව.

ඒ වෙලාවේ දී රාජ දේවිය කිව්ව ඔබ බයවෙන්න එපා. මේ අපේ අත දරුවට රජතුමා බොහෝම ආදරේ කරනව. ඒක නිසා රජ්ජුරුවෝ කෑම කන්න වාඩි වුනාම මේ අතදරුවා එතුමාට වඩා ගන්න දෙමු. එතුමා දරුව සමඟ සුරතල් කරමින් තියන ආහාර ගනීවී කියල ඔහුගේ සිත සනසල තියන එළවළු ආදිය සම්පාදනය කරන්න කිව්ව. අරක් ඇමියා ද මස් නොමැතව ආහාර පාන කෑම මේසයට සූදානම් කලා. ඒ අතර රජතුමා රාජ සභාවෙන් නැගිටලා මධ්‍යසාර පානය කරලයි මේ ආහාර වේල ගත්තේ. ඉතිං එදා දවසෙත් සුරා මතින් මත් වූ රජතුමා කෑම කන්න ඇවිත් වාඩිවුනා. රාජදේවියත් ඒ වෙලාවේ දරුව වඩාගෙන ඇවිත් රජතුමාගේ අතට දුන්න. දරුව වඩා ගත්ත මේ රජ්ජුරුවෝ දැන් ඉන්නේ මද සිහියෙන් සුරාපානය නිසා නියම ප්‍රකෘර්ති සිහියක් නැහැ මද සිහියෙන් ඉන්නෙ.

එතුමා කෑම මේසය දිහාවේ බළල මොනවද තියෙන්නෙ කියල විමසල බලනකොට කිසිම මාංශ ආහාරයක් පේන්න නැහැ. අරක් ඇමියාගෙන් ඇහුව කෝ අද මාංශ ආහාර ? ඔහු ඇත්තම කිව්ව අනේ දේවයන් වහන්ස මට සමාවනු මැනවි. අද උයන්න තිබුන මස්කැටිය බල්ලෙක් ඩැහැගෙන ගිහිල්ල අද මේ රටේ කොතනකවත් මස් ටිකක් සොයාගන්න නැහැ. ඒ නිසා අද මම නිර්මාංශ භෝජනයක් පිළියෙළ කලා කිව්ව.

දැන් රජ්ජුරුවෝ ඉන්නෙ අවසිහියෙන්නෙ. මේ තමන්ගෙ අතේ ඉන්නේ තමාගේ පුතා කියලවත් මතක නැහැ. ඒක නිසා මේ භයානක සුරාවේ ආදීනව මොනතරම් නම් භයානකද කියනවානම් තමන්ට දාව උපන්න මේ කිරි කැටි දරුවාගේ බෙල්ල හරියට අර කුකුලෙකුගේ බෙල්ල අඹරවල මරන්න වගේ මේ සුරතල් දරුවගේ බෙල්ල කරකවල මරල දුන්න අරක්

ඇමියාට උයන්න. මම රජකෙනෙක් නේද? මටද මස් නැත්තේ වහාම මේ මාංශය සම්පාදනය කරල දෙන්න කියලා මේ අවාසනාවන්ත භයානක සිද්ධිය දෙස බලගෙන හිටිය රාජ දේවිය කම්පාවෙලා ක්ලාන්තය හැදිල බිම ඇදගෙන වැටුන එතුමිය හඩා වැලපෙන්න පටන් ගත්තා. දැන් ඉතිං රජ්ජුරුවෝ සුරාමතින් මත් වී මද සිහියෙන් වාඩිවෙලා ඉන්නව. ඔය අතර අරක් ඇමියා වෙව්ල වෙව්ලා මැරුණා වූ මේ කුඩා දරුවාගේ මාංශය ක්‍රම කිහිපයකට සකස් කලා. මස් බැදල හැදුවා. මස් හොද්ද හැදුව. මස් කිරට හැදුවා. මස් සුප් එක වගේ හැදුව. මේ සියල්ල ඉක්මනටම හදල ඉක්මනටම රජතුමාට දුන්න. රජ්ජුරුවෝ දන්නෙ නෑ මේ තමන්ගේ පුතාගේ මස් කියල. රජතුමා තමාගේම පුතාගේ මස් සමඟ හොඳට කෑම කෑවා කෑම අරගෙන ගිහින් නිදාගත්ත. පැය කීපයකින් නින්දෙන් අවදිවෙලා දැන් වෙරිමත හිඳිල. අඩ අඩා ඉන්න රාජදේවියට කිව්වා දේවිනී පුතා ගේන්න වඩා ගන්න කිව්වා.

ඒ වේලාවේදී රාජ දේවිය කියා සිටිය අනේ දේවයන් වහන්ස තමුන් වහන්සේටත් පුත්තු ඉන්නවද? තමන් වහන්සේ හදාවඩාගන්න හිටිය. රටක් වටින පුතා ඔබතුමගේම අතින් බෙල්ල මිරිකල මරල ඒ මාංශය උයල කාල නේද අද බඩ පුරවාගෙන ඉන්නෙ කියල. එතුමිය අඩන්න ගත්ත. මධ්‍යපානයෙන් මත්වෙලා සුරා පානයෙන් සිහිමුලා වෙලා. මේ රට පාලනය කරන්න හිටිය මගේ පුතාගේ බෙල්ල කරකවල අරක් ඇමියා ලවා උයා පියාගෙන කෑවනේද? ඔය බඩේ පුරවගෙන ඉන්නෙ දරුමාංශය සමඟ ආහාර නේද? තවත් ඔබතුමාට දරුවන් ඉන්නවද කියල දේවිය බිම සිහිසුන්ව වැටුන දරුදුක දරා ගන්න බැරිව දැන් රජතුමාගේ සුරා මත සන්සිදුන නිසා ඔහුට තේරෙනව. අහෝ මම කරගත්ත මහා අපරාධයක බරපතලකම කියල මේ සුරාපානය මොනතරම් නම් භයානක දෙයක්ද කියල වැටහුනා. එක අතකින් මහා නින්දාවකට පත්වුනා. එක අතකින් මහා ලැජ්ජාවකට පත් වුනා. ඒ නිසා එතුමා එදා පොලවේ අත තියල ප්‍රාර්ථනවක් කලා.

මේවගේ මම මෙපමණ කාලයක් යම්බදු කුසලයක් සිදුකරගෙන ඇත්නම් ඒ සියලු කුසල් බලයෙන් මට නිවන් දක්නා ජාති දක්වා සසර වසනාතුරු කවදාවත් මේ වගේ සාහසික ලෙස වැඩ කරන්නට හේතුවන මද්‍යපානයක් මාගෙන් නැවත සිදුනොවේවා ! නොවේවා ! කියල අධිෂ්ඨාන කලා.

අපේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වදාළ එදා ඒ ජත්තපාණි රජතුමා නමින් තමන්ගේ පුතාගේ මාංශය අනුභව කලේ මේ ශාරිපුත්ත ස්ථවිරයන් වහන්සේයි. පෙර සසරදී හැබැයි එතුමා එදා පටන් නැවත කවම කවදාවත් සසර ගමනේදීවත් සුරා පානයක් කරල නැහැ. ඒක මේ ශාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ පෙර සසර පටන් පුරුදු කර ගෙන පැමිණි ශ්‍රේෂ්ඨ ධර්මතාවයක් බව පහදා දුන්නා.

හතරවන කරුණ තමයි කිසිම දේකට මෙම ශාරීපුත්ත ස්ථවිරයන් වහන්ස පෙර සසර පටන් දැඩි ආලයක් ආශාවක් නොකර කෙනෙක් වශයෙන් හිත දියුණු කරගෙන ආව. පෙර ආත්ම භාවයකදී මෙම ශාරීපුත්ත මහා රහතන් වහන්සේ ''කිත වාස'' නමින් රජකෙනෙක්ව ඉපදී රජකම් කරමින් හිටිය මේ කිතවාස රජ්ජුරුවන්ටත් එම අග්‍රමහේෂිකාවටත් මුලදී දරු සම්පත් තිබුනේ නැහැ. ඒ කාලේ පසේ බුදුවරයන් වහන්සේලා වැඩ හිටිය කාලයක් නිසා උන් වහන්සේලාගේ උපදෙස් අනුව බොහෝ පිංදහම් සිදුකලා දරු සම්පත් පතාගෙන.

මේ අතර මේ දෙදෙනා නිසා දරුවෙක් උපන්නා. මේ දරුවා උපන්න නැකතට අනුව දෛවඥයෝ කිව්ව. රජතුමනි, මේ දරුවා බොහෝම කිපෙන සුළු දරුවෙක් වෙනව කියල. ඒ දරුවා තරුණ වයසේදී වතුර නැති වීමෙන් මිය පරලොව යනව කියල උපන්න නැකතට අනුව ඔවුන් කිව්ව. ඉතිං මේ රජතුමා ඉතා ආදරයෙන් මෙම දරුවා හොඳට හදා වඩා ගත්ත. පුදුම ආදරයක් මේ දරුවට තියෙන්නෙ. මේ දරුවා වතුර නොමැතිවීම නිසා මිය යනව කියපු නිසා රටේ හැමතැනම නගරයේ

ඇතුලතයි පිටතයි උයනෙයි සෑම තැනකම ජල පහසුකම් ඇතිකලා. මේ දරුවාට වතුර හිග නොවෙන්නයි එහෙම කලේ.

ඒ අතර මේ දරුවා ඉතා කුඩා කාලයේ ඉඳලම බොහෝම කිපෙනව. කුණකටුව වගේ පුංචිදේට පවා කිපෙනව. අන්තප්පුරයේ කිසිකෙනෙකු සමඟ සමගියෙන් ඉන්න බැහැ. හැමෝටම කිපිල ගහනව. බනිනවා. දොස් කියනව. තරහ වෙනව. නොයෙක් විදියට මේ දරුවගේ පැවතුම් ඉතාමත්ම ආශීලාචාරයි ඒත් රජතුමා මේ දරුවා ආදරයෙන් රාජ කුමාරයා හැටියට හදා වඩා ගත්ත. මේ දරුවත් බොහොම ලස්සනට වැඩුන. අවුරුදු විස්සක තරම් වයස කාලයේදී මේ දරුවා ඇතා පිට නංවලා විශාල පිරිසක්ද සමඟ උයන්සිරි නරඹන්න පිටත් කරලා යැව්ව. එදා උදෑසන මෙසේ යනකොට "සුනේත්‍ර" කියන පසේ බුදුරජාණන් වහන්සේ මගදී පිඩුසිඟා වඩිනව දකින්න ලැබුන. මේ දරුවා නපුරු දුෂ්ඨ සිතින් අර පසේ බුදුරජාණන් වහ්නසේගේ ලඟට ගිහිල්ල උන්වහන්සේගේ මැටි පාත්‍රය අරගෙන පොළොවේ ගැහුවා. ඒ පාත්‍රය කුඩු වුනා.

ඒ වෙලාවේදී එම පසේ බුදුරජාණන් වහන්සේ ඒ දරුවා කෙරෙහි මහත් කරුණාවෙන් මේ කුමාරයාගේ මුහුණ දෙස බැලුව. කුමාරයාගේ මුහුණ දෙස බලනකොට මහත්හඬින් ගර්ජනාත්මකව තර්ජනය කලා. තමුන්නාන්සේ මගේ දිහාවෙ බලන්නෙ මොකද? තමුන්නාන්සේ දන්නෙ නැද්ද මම කිතවාස රජ්ජුරුවන්ගේ දුෂ්ඨ කුමාරයයි කියනකොට පසේ බුදුරජාණන් වහන්සේ ක්‍ෂණයකින් අහසට පැන නැගිලා අහසෙන්ම වැඩම කලා. උන් වහන්සේ එතනින් නොපෙනි ගියා. විතරයි මේ රාජ කුමාරයා දනවෝ, දනවෝ කියමින් වතුර ඉල්ලුවා.

මේ තරම් සුලභව තිබුන ජලාශවල වතුර සියල්ලම හිඳිල වතුර පතක් ගන්නට නැති හැටියට සියලුම වතුර හිඳිල ගියා බලන්න කරගත්ත කර්මය මොන තරම් භයානක දෙයක්ද මේ දරුවා එදා කලුරිය කරලා අවීචිමහා නරකයේ උපන්න මේක

මහා අවාසනාවන්ත පාපයක්. අවීචියේ බෝහෝ කාලයක් දුක් විඳල විඳල තිරිසන් ආත්මභාව පන්සියයක්ම දුක් වින්ද ඔය වගේ එදා කරගත්ත එක අකුසල කර්මයෙන් මහා දුක්ඛස්ඛන්ධයක් විඳල අපේ ශාසන කාලයේදී දඹදිව කේවට්ට කුලයක ඉපදිලා මහා කච්චායන මහ රහතන් වහන්සේ සමීපයේ පැවිදි වී වැඩිකල් නොගොස් සව් කෙලෙසුන් නසා මහා රහත් භාවයට පත්වුනා. එම ස්වාමීන් වහන්සේ හඳුන්වනු ලබන්නේ ''සානුපබ්බතවාසී පොට්ඨපාද'' මහා රහතන් වහන්සේ කියලයි.

එදා ඒ කිතවාස රජ්ජුරුවෝ ඒ පුතාගේ අභාවය ගැන ආරංචි වෙලා එතනට පැමිණිලා පුදුමාකාරයේ වේදනවක් ඇතිවී බිම දිගාවෙලා අඬ අඬා ශෝකයෙන් තැවී තැවී කෑම වේල් හතක් ගන්නේ නැතිව හිටිය. මැති ඇමතිවරුද තවත් සෙසු පිරිසද නොයෙක් ආකාරයෙන් එතුමාගේ හිත හදන්න උත්සාහ ගත්ත. පුත්‍ර ස්නේහය මොනතරම්ද කියනවානම් එතුමා දවස් තුන හමාරක්ම නැගිට්ටේ නැහැ. කෑම වේල් හතක් කියන්නේ ඒකයි. ඉන් පසුව එම රජතුමාට මෙහෙම අදහසක් ඇතිවුනා.

මේ දරුවා උපන්න තැනකට අනුව දෛවඥයෝ කිව්ව නේද මේ දරුවා කිපෙන සුළු කෙනෙක්. මේ දරුවා කවදාකහරි වතුර නැතිව මිය යනව කියල තිබුන නේද? ඉතිං මේ දරුව සසරින් ගෙනා ආයුෂනෙ, ඒ දරුවා විසින් සිදුකරගත්ත බලවත් කර්මයෙන් නේද මේ විපත සිදුවුනේ ? දැන් මමත් මේ මියගිය දරුව වෙනුවෙන් ශෝකවෙමින් හඬ හඬා මමත් ආහාර පාන නොගෙන ඉදල මමත් මියගියොත් එයින් ඇති ඵලයක් නැහැ නේද? මේ දරු සෙනෙහස නිසානේ මට මේ තරම් වේදනාවක් ආවේ. මින් ඉදිරියට මගේ මේ ජීවිතය පුරාම යම් බඳු පිනක් සිදුකරගෙන තිබෙනවා නම් ඒ පිංබලයෙන් නිවන් දකිනා තුරු හිත ඇති කෙනෙක් ගැන හරි හිත නැති දෙයක් ගැන හරි කවම කවදාවත් මගේ හිතේ ආශාවක් තෘෂ්ණාවක් අධික සෙනෙහසක් පහළ නොවේවා කියා එම රජතුමා ප්‍රාර්ථනා කලා.

එම උතුම් ගුණය මෙම ශාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ රහත්වන තුරුම පුරුදුකරමින් ආව. එදා ඒ කාලයේ කිතවාස රජතුමා තමයි අද මේ කාලයේ ශාරිපුත්ත ස්ථවිරයන් වහන්සේ කියා පහදා දෙමින් බුදුරජාණන් වහන්සේ වදාළ මෙම ශාරිපුත්ත ස්ථවිරයන් කිසිදාක ඊර්ෂ්‍යා කරන්නේ නැහැ. කිසිදාක වෛර කරන්නේ නැහැ. කිසිදාක මත්පැන් පානය කලේ නැහැ. කිසිදාක කිසිම දෙයක් ගැන කිසිම කෙනෙක් ගැන අධික සෙනෙහසක් ඇති කර ගත්තේ නැහැ. මෙම උසස් ගුණ ධර්මයන් පෙර සසරදිත් පුරුදුකරගන පැමිණි බැවින් ඒකාසංඛ්‍ය කල්පලක්ෂයක් පුරා කිසිදවසක අටමහා නරකයක උපන්නේ නැහැ. උන්වහන්සේ ඔසුපත් නරකයක උපන්නේ නැහැ. ලෝකාන්තරික නරකයක උපන්නේ නෑ. මනුෂ්‍යලෝකයේ උපන් ආත්ම වලදී අන්ධයන් වී උපන්නේ නෑ. ගොළුවන් වී උපන්නේ නැහැ. මන්ධ බුද්ධිකයන් වී උපන්නේ නෑ. අංගවිකලයන් වී උපන්නේ නෑ. උන් වහන්සේ උපනුපන්භවයක් පාසාම බොහෝම ඥාණවන්ත ජීවිතම ලබා ගත්තා. එසේ පාරමී ගුණ පුරාගෙන ඇවිත් තමයි සම්බුද්ධ ශාසනයෙහි අග්‍රශ්‍රාවකයන් වහන්සේ බවට පත්වුණේ.

මෙම ප්‍රවෘත්තිය මා විසින් හදුන්වන්නට යෙදුනේ අපේ මේ වයෝවෘධ මවුවරු පියවරු. ඒ වගේම මැදිවයසේ සිටින අය තරුණ වයසේ සිටින අය කුඩා වයසේ සිටින අය අපි හැමදෙනාම හිතන්නට ඕනෑ. අපිත් අර සැරියුත් ස්වාමීන් වහන්සේ වගේ අධිෂ්ඨාන කලොත් අපටත් ගෙවෙන මොහොතක් පාසා යහපත් ගුණධර්ම අපේ චිත්ත සන්තාන තුල වර්ධනය කරගත හැකි වෙනව.

අපි හිතන්නට ඕන නිවන් දකිනා ජාති දක්වා අප අතින් කවදාවත් ප්‍රාණඝාතයක් නොවේවා කියල අධිෂ්ඨාන කරන්නට ඕනෑ.

නිවන් දකිනා ජාති දක්වා අන් සතු නූල් පටක් වැනි දෙයක්වත් සොර සිතින් අපට ගන්නට සිතක්වත් පහළ නොවේවා කියා අධිෂ්ඨාන කරමු. නිවන් දකිනා තුරු අපෙන් කාමමිත්‍යාචාරය කියන නින්දිත පාපය නොවේවා කියා ප්‍රාර්ථනා කරන්න ඕනෑ. නිවන් දකිනාතුරු අපට කවදාවත් අසත්‍ය වචනයක් කථා කරන්න නොවේවා කියල ප්‍රාර්ථනා කරමු. නිවන් දකිනා තුරා අපට කවදාවත් මධ්‍යපානයක් සිදුනොවේවා කියා ප්‍රාර්ථනා කරන්නට ඕනෑ. නිවන් දකිනා තුරු අපට කවමදාවත් කේලාම් බසක් කියන්න නොවේවා කියා අධිෂ්ඨාන කරන් ඕනෑ. නිවන් දකිනා තුරා අනුන්ගේ සිත්වලට වේදනාව ගෙන දෙන පරුෂ වචනයක් කියන්න නොවේවා කියල අධිෂ්ඨාන කරන්න ඕනෑ. නිවන් දකිනා තුරා අපට හිස්වචනයක් කියන්න නොලැබේවා කියා අධිෂ්ඨාන කරන්න ඕනෑ. නිවන් දකිනා තුරු අපට අනුන්ගේ වස්තුවලට ආශාවක් ඇති නොවේවා කියා ප්‍රාර්ථනා කරන්න ඕනෑ. නිවන් දකිනා තුරා අපට කවදාවත් කිසිකෙනෙක් ගැනවත් ක්‍රෝධයක් වෛරයක් ඊර්ෂ්‍යාවක් ඇති නොවේවා කියා අධිෂ්ඨාන කරන්නට ඕනෑ. නිවන් දකිනා ජාති දක්වා භවයක් පාසා ජාති ජාතින් සම්මා දිට්ඨියම පහළ වේවා කියා අධිෂ්ඨාන කරන්නට ඕනෑ.

නිවන් දකිනා තුරා අපට පංචශීලය මැනවින් ආරක්ෂා කරන්න ලැබේවා කියා අධිෂ්ඨාන කරන්න ඕනෑ. නිවන් දකිනා ජාති දක්වා අපට උපෝසථ සීලය සමාදම්ව රකින්නට ලැබේවා කියා අධිෂ්ඨාන කරන්නට ඕනෑ. නිවන් දකිනා තුරා අපට මෛත්‍රී වඩන්නට වාසනාව උදාවේවා කියා අධිෂ්ඨාන කරන්නට ඕනෑ. නිවන් දකිනා තුරු අපට මුදිතාව දියුණුකර ගන්න ලැබේවා කියා අධිෂ්ඨාන කරන්න ඕනෑ. නිවන් දකිනා තුරු අපට උපේක්ෂා ගුණය මැනවින් පිහිටවා කියා අධිෂ්ඨාන කරන්නට ඕනෑ. නිවන් දකිනා තුරු අපට කල්‍යාණමිත්‍ර උතුමන්ගේම ආශ්‍රය ජාති ජාතින් ලැබේවා කියා අධිෂ්ඨාන කරන්න ඕනෑ. නිවන් දකිනා තුරු අපට සද්ධර්මයම අහන්න ලැබේවා කියා අධිෂ්ඨාන කරන්න ඕනෑ. නිවන් දකිනා තුරා අපට යෝනිසෝ මනසිකාරයෙන්ම සිහිය හසුරුවන්නට ලැබේවා කියා අධිෂ්ඨාන

කරන්න ඕනැ. නිවන් දකිනා තුරු අපට සතරමගඵල නිවන සඳහා උපකාරවන පිළිවෙත් පුරාගන්නට ජාති පාතිත් ලැබේවා කියා අධිෂ්ඨාන කරන්න ඕනැ.

මේ වාගේ අධිෂ්ඨාන බල සිතේ දරාගෙන අපි උදේ සවස පංචශීලය තිසරණ සහිතව සමාදම්ව එය නිතර නිතර සිතෙන් මෙනෙහි කරන්නට ඕනැ. එසේම පොහොය දවසේදී උපෝසථ සීලය සමාදම්ව එය නිතර සිතෙන් මෙනෙහි කරන්නට ඕනැ. ඉතිපිසෝ ගාථා පාඨය නිතර නිතර සිතෙන් මෙනෙහි කරන්න ඕනැ. ස්වාක්ඛාතෝ ගාථාව නිතර නිතර සිතෙන් මෙනෙහි කරන්න ඕනැ. කරණීය මෙත්ත සූත්‍රය, මහා මංගල සූත්‍රය, රතන සූත්‍රය, නිතර නිතර සිතින් කියවන්නට ඕනැ. මෙනෙහි කරන්න ඕනැ.

මේවා නිතර නිතර කුසල් සිතින් මෙනෙහි කරනවා නම් අපේ සිතේ සිතන පතන දේ ඒකාන්තයෙන්ම සඵල වෙනව. ඉෂ්ඨසිද්ධ වෙනව. බුදුරජාණන් වහන්සේ දේශනා කරල තිබෙනව. **ඉජ්ජති භික්ඛවේ සීලවතෝ චේතෝ පණිධි විශුද්ධත්තා** මහණෙනි, ශීලවන්තයාගේ සිතේ ප්‍රාර්ථනා ඒකාන්තයෙන්ම ඉෂ්ඨසිද්ධ වෙනව. ඔහුගේ සීලයේ පිරිසිදු නිසා කියා දේශනා කලා. ඒක නිසා අපි නිතරම නිත්‍ය වශයෙන් පංචශීලය සුරකිමින් සීලවන්තයෝ වෙමු. එසේම තුණුරුවන් පිළිගැනීමේ ශ්‍රද්ධාව දියුණු කරගනිමු. එසේ නිතරම කුසල් සිදුකර ගැනීමට සිහිය පවත්වාගෙන උත්සාහවත් වෙමු. එසේම සිහිය තැන්පත් වන හැටියට කුසල් දහම් රැස්කරගන්න උනන්දු වෙමු. නිතර නිතර බුදුබණ අහමින් බුදුබණ කියවමින් බුදුබණ මෙනෙහි කරමින් නුවණ දියුණු කරගන්නට අධිෂ්ඨාන කරගනිමු.

මෙතෙක් වේලා උතුම් ශීලයක පිහිටා ධර්මශ්‍රවණය කල පිංවත් සැමටත් මෙලොව වශයෙන් නිදුක් නිරෝගීව සුවපත්ව ශතවර්ෂාධික කාලයක් දීර්ඝායුෂ ලැබේවා! භවයක් පාසාම ශ්‍රද්ධා, ශීල, ශ්‍රැති, ත්‍යාග ඥාණගුණ සම්පන්නව කල්‍යාණමිත්‍ර ජීවිතම

ලැබේවා! තමා තමා පතන බෝධි ඥාණයකින් බුදු පසේ බුදු මහා රහතන් වහන්සේලා නිවී සැනසී වදාළ සදාකාලික ප්‍රණීත අග්‍ර අමා මහ නිවන් සුව පිණිස මේ උදාර කුසල සම්භාර ධර්මය හේතුවේවා වාසනා වේවා කියා නිවන් සුව ප්‍රාර්ථනා කරමු.

**සාදු ! සාදු ! සාදු !**

**මෙම දහම් පොත නැවත මුද්‍රණය කර ධර්ම දානය වශයෙන් පිරිනැමීමට ඔබ අදහස් කරන්නේ නම් කරුණාකර අපගෙන් විමසන්න. ඒ සඳහා අවස්ථාව ලබාදිය හැකිය.**

**දුරකථන අංකය: 0777 - 177 514**



නීටි ප්‍රින්ටර්ස් - වයි.එම්.බී.ඒ. ගොඩනැගිල්ල,
රාහුල පාර, මාතර. ටෙලි. 041-2223174